දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax )0112692913

විද්‍යුත් තැපැල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல )NA/07/09/2019
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. )

දිනය )
திகதி )2021.10.05
Date )

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

සියළුම අයදුම්කරුවන් වෙත,

**<u>බන්ධනාගාර හෙද නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීම .</u>**

බන්ධානාගාර හෙද නිළධාරී තනතුර සඳහා ඔබ විසින් බන්ධනාගාර දෙපාර්තමේන්තුව සඳහා ඉදිරිපත් කරන ලද අයදුම්පත හා බැඳේ.ඒ අනුව ඔබගේ සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණය 2021.10.10 දින පෙ.ව 8.30ටසෞඛ්‍ය අමාත්‍යාංශයේ දී පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත.

02.ඒ අනුව පහත ලිපි ලේඛනවල මුල් ලේඛන හා සත්‍ය බවට තමන් විසින් සහතික කරන ලද ඡායා පිටපත් ද රැගෙන නියමිත දින සම්මුඛ පරීක්ෂණයට සහභාගී වන මෙන් දන්වා සිටිමි.ඡායා පිටපත් සියල්ල කාඩ්බෝඩ් ලිපි ගොනු කවරයක අමුණා කවරයේ ඉහළ දකුණු පස ඔබගේ නම,ජාතික හැඳුනුම්පත් අංකය හා කැඳවීම් අංකය සටහන් කරගෙන පැමිණීමට කාරුණික වන්න.ඔබ විසින් පහත සඳහන් ලිපි ලේඛන සම්මුඛ පරීක්ෂණය පැවැත්වෙන දිනයේ දී ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේනම් ඒ සම්බන්ධව පසුව කරනු ලබන ඉල්ලීම් සලකා බලනු නොලැබේ.

i. උප්පැන්න සහතිකය.
ii. ජාතික හැඳුනුම්පත හෝ වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ වලංගු රියදුරු බලපත්‍රය.
iii. අයදුම් කළ වර්ෂයට අදාළ අ.පො.ස. (උ/පෙළ ) විභාග ප්‍රතිඵල ලේඛන හා Z අගය දැක්වෙන සහතිකය.(විභාග දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලබන ප්‍රතිඵල ලේඛන පමණක් සලකා බලනු ලබන අතර පාසල්වල විදුහල්පතිවරුන් විසින් නිකුත් කරනු ලබන සහතික සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු නොලැබේ.)
iv. අ.පො.ස. (සා/පෙළ ) විභාග ප්‍රතිඵල දැක්වෙන සහතිකය. (විභාග දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරනු ලබන ප්‍රතිඵල ලේඛන පමණක් සලකා බලනු ලබන අතර පාසල්වල විදුහල්පතිවරුන් විසින් නිකුත් කරනු ලබන සහතික සම්මුඛ පරීක්ෂණයේ දී සලකා බලනු නොලැබේ.
v. අවිවාහකබව සනාථ කිරීම සඳහා සාමදාන විනිශ්චයකරුවෙකු ඉදිරියේ අත්සන් කරන ලද දිවුරුම් ප්‍රකාශයක්.දිවුරුම් ප්‍රකාශයේ රු. 50/- ක මුද්දර අලවා ඒ මත අත්සන් කළ යුතුය.
vi. විශ්වවිද්‍යාලයක හෝ වෙනත් රජයේ / සෞඛ්‍ය, අමාත්‍යාංශයේ පාඨමාලාවකට ලියාපදිංචි වී හෝ සහභාගී නොවන බවට ඔබගේ බහුමාන සහතිකය.
vii. ග්‍රාම නිලධාරී සහතිකය ( DS – 04 ආකෘතියෙන් ඉදිරිපත් කල යුතුය.)

03.සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ නිර්දේශ අනුව සුදුස්සන් තෝරාගනු ලැබේ.(මෙය සුදුසුකම් පරීක්ෂා කිරීම සඳහා පවත්වනු ලබන සම්මුඛ පරීක්ෂණයක් පමණි.සම්මුඛ පරීක්ෂණයට සහභාගී වූ පමණින් ඔබ අනිවාර්යයෙන් බන්ධනාගාර හෙද පුහුණුවට බඳවා ගන්නා බවක් මින් අදහස් නොවන බව සැලකිය යුතුය. සම්මුඛ පරීක්ෂණයෙන් පසු සුදුසු වූ /නුසුදුසු වූ හා තෝරා ගන්නා / තෝරා නොගන්නා අයදුම්කරුවන් පිළිබඳව තොරතුරු බන්ධනාගාර දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේ දී ඔබ වෙත දැනුම් දෙනු ඇත.

Gamage

චාමික .එච්.ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) 11

චාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

අත්/කළේ: ඒ.එම්.කේ.කේ. අත්තනායක
අතිරේක ලේකම්(පාලන) 11
සෞඛ්‍ය ලේකම් වෙනුවට

385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, කොළඹ 10.385,வணக்கத்துக்குரியபத்தேகமவிமலவங்சதேரோமாவத்தை,கொழும்பு 10.
385, Rev. BaddegamaWimalawansaTheroMawatha, Colombo 10, Sri Lanka.